මැරිටයිම්පත්තු ප්‍රදේශීය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 18 දින විගණන සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 12 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනයන්ට කෙරෙන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ .

1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .

1.3.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) අයවැය ලේඛනය සහ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති තථ්‍ය සංඛ්‍යාවන් අතර ඇති වෙනස්කම් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි .

( ආ ) මූල්‍ය ප්‍රකාශනයන්හි ආදායම් සහ වියදම් ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල යටතේ වර්ග කර දක්වා නොතිබුණි .

(ඇ) ණයගැතියන්, තැන්පතු සහ හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණ මූල්‍ය ප්‍රකාශනයන් සමග ඉදිරිපත් කර නොතිබුණි .

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

ආදායම්, වියදම් සහ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරික්ෂණය වූ ගිනුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දක්වා ඇත .

| මූල්‍ය ප්‍රකාශනයන් කෙරෙහි බලපෑම | ආදායම | | වියදම | | වත්කම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | - | - | 01 | 2,768,809 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 1,719,164 | 01 | 4,790 | - | - |

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු . 31,064,472 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය .

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 6,112,606 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,001,409 ක් විය .

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු . 000 |
| i | වරිපනම් සහ බදු | 61 | 187 | - |
| ii | කල්බදු | 7,900 | 6,170 | - |
| iii | බලපත්‍ර ගාස්තු | 390 | 558 | - |
| iv | වෙනත් ආදයම් | 14,918 | 19,126 | 175 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) 2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරින් ගෙන් රු. 1,109,250 ක් වු උසාවි දඩ අයවිය යුතුව තිබුණි .

(ආ) 2011 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

2.3 අවිධිමත් ගනුදෙනු

ඇතැම් නැවත පදිංචි කිරිමේ කාර්යයන් බාහිරව සලසා ගැනිම සඳහා යෙදවූ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ලෙස රු. 550,028 ක් ගෙවා තිබුණි . ඉහත සඳහන් වියදම් සභා අරමුදලෙන් දරා තිබුණ ද , එම ගෙවීම් සඳහා අයවැය ලේඛණයෙහි වෙන් කිරිම් සිදුකර නොතිබුණි .

2.4 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ .

(අ) ප්‍රදාන මගින් ලබාගෙන සභාව විසින් උපයෝජනය කරනු ලබන වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා නොතිබුණි .

(ආ) පුස්තකාල පොත් 212 ක් අගය කර අවසාන ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි .

(ඇ) ප්‍රවර්තන මුදල් වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පතු මත පොලිය ගණනය කර අවසාන ගිණුම් වල ආදායම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි .

(ඈ) මස් වෙළඳ පොළ බදු දීමට අදාලව එකතු කළ රු . 1,204,403 ක් වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි .

(ඉ) මස් වෙළඳ පොල බදු දීමට ආදාළව එකතු කළ රු. 251,742 ක් වූ ජාතිය ගොඩනැගිමේ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි .

(ඊ) මස් වෙළඳ පොළ බදු දීමට අදාළව එකතු කළ රු. 26,998 ක් වූ රඳවුම් බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි .

(උ) උප කාර්යාල 05 අතුරෙන් 02 ක් ක්‍රියාත්මකව නොතිබුණි .

3 . පද්ධති හා පාලන .
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) අදායම් රැස් කිරිම

( ආ ) ස්ථාවර වත්කම්

( ඇ ) ගිණුම්කරණය .

(ඈ) වාහන උපයෝජනය

(ඉ) විවිධ තැන්පතු

(ඊ) අයවැය පාලනය